සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2019

06 ශ්‍රේණිය

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

### I කොටස

- අංක 01 සිට 10 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශු. බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොත් ගණන වනුයේ,

(1) 27 කි. (2) 73 කි. (3) 46 කි. (4) 23 කි.

02. නව ගිවිසුමේ ඇතුළත් පළමු ග්‍රන්ථ හතර ...................... ලෙස හඳුන්වයි.

(1) පංච පුස්තකය (2) ශුභාරංචි ග්‍රන්ථ
(3) ද්විතීය සම්මත ග්‍රන්ථ (4) නීති පොත්

03. ශු. මතෙව් තුමා ක්‍රිස්තුන් වහන්සේව හඳුන්වන්නේ,

(1) මෙසියස් වහන්සේ ලෙසය. (2) ගැලවුම්කරුවාණන් ලෙසය.
(3) දිවැසිවරයෙක් ලෙසය. (4) මැවුම්කරුවාණන් ලෙසය.

04. දෙවියන් වහන්සේ පක්ෂීන් හා මසුන් මවන ලද්දේ,

(1) පළමු දිනයේ දී ය. (2) හතරවන දිනයේ දී ය.
(3) පස්වන දිනයේ දී ය. (4) හයවන දිනයේ දී ය.

05. ජේසුස් වහන්සේ මෙලොවට පැමිණියේ,

(1) ලොව පාලනය කිරීමට ය. (2) ගැලවීමේ කාර්ය ක්‍රියාත්මක කිරීමට ය.
(3) ප්‍රාතිහාර්ය කිරීමට ය. (4) දේව රාජ්‍ය පිහිටුවීමට ය.

06. දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතහි බාහිර සලකුණ වනුයේ,

(1) පූප හා මිදි යුෂ ය. (2) ශු. තෛලය ය.
(3) පාස්කු ඉටි පහන ය. (4) කුරුසිය ය.

07. ක්‍රිස්තුස් වහන්සේ අපෝස්තුළුවරුන්ට දර්ශනය වූයේ,

(1) පෙන්තකොස්ත දිනයේ දී ය. (2) පාස්කු ඉරුදින සැඳෑවේ ය.
(3) මහ බ්‍රහස්පතින්දා දින දී ය. (4) ගොබ් ඉරිදා ය.

08. 'දූරා' ස්ථානයේ තැබූ රන් රූපයට වන්දනා නමස්කාර කළ යුතු බවට රාජ ආඥාවක් නිකුත් කළ රජතුමා වනුයේ,

(1) පිලාත් රජු ය. (2) පාරාවෝ රජු ය.

(3) හෙරෝද් රජු ය. (4) නෙබුකද්නෙසර් රජු ය.

09. දේව දරුකම නමැති නොමැකෙන ලාංඡනය කිතුණුවන් තුළ සනිටුහන් වන දේව ප්‍රසාද නිධානය වන්නේ කුමක්ද?

(1) අභිවෘද්ධි ආලේපය (2) ප්‍රසාද ස්නාපනය

(3) දිව්‍ය සත්ප්‍රසාදවහන්සේ (4) රෝගීන්ගේ ආලේපය

10. "ඔබ යමෙකුගේ පව් කමා කරන්නහු ද ඒවා ඔවුන්ට .............................. ලැබේ.

(1) දඬුවම් කරනු (2) ආශිර්වාද කරනු

(3) කමා කරනු (4) දයාව කරනු

- **අංක 11 - 15 දක්වා නිවැරදි වාක්‍යයට (✓) ලකුණද, වැරදි වාක්‍යයට (X) ලකුණද යොදන්න.**

11. ශු. මාක් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙකි. ( )

12. දෙවියන් වහන්සේ පළමු දිනයේ දී අහස හා ජලය මැවූ සේක. ( )

13. ඕනෑම අවස්ථාවක දෙවිඳුන්ගේ නාමයෙන් දිවිරීමට අපට හැකිය. ( )

14. මෝසෙස් තුමා දස පනත ලබා ගැනීමට පෙර දින 40 ක් යාච්ඤා කළ සේක. ( )

15. ආරම්භක දේව ප්‍රසාද නිධාන 03 කි. ( )

- **අංක 16 - 20 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා ලියන්න.**

( ජීවන හුස්ම / 04 කි. / අයකැමියෙකි / 02 කි. / හිරුඑළිය / යාච්ඤාව )

16. ශු. මතෙව් තුමා කැඳවීමට පෙර ........................................................................................................ කි.

17. දෙවියන් වහන්සේ මිනිසාගේ නාස් පුඩුතුළට ........................................................................ හෙළු සේක.

18. දේව ප්‍රසාද නිධානයක ප්‍රධාන ලක්ෂණ ............................................................................ ක් ඇතුළත් වේ.

19. දෙවියන් වහන්සේ දුදනන්ට හා සුදනන් හට තම ........................................................ උදා කරවන සේක.

20. සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන .................................................................................................. කි.

(ල. 2 × 20 = 40)

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

01. (i) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.
    (ii) ශුභාරංචි ග්‍රන්ථ 02 ක් ලියන්න.
    (iii) බිළිඳු ජේසු බැහැදැකීමට ගිය ශාස්ත්‍රවන්තයන් ගෙන ගිය දේවල් 02 ක් ලියන්න.
    (iv) සුව දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන 02 ක් නම් කරන්න.
    (v) ශු. ජොහාන් තුමාගේ මව හා පියා නම් කරන්න.
    (vi) දෙවියන් වහන්සේ මිනිසාව මවන ලද උන්වහන්සේගේම ලක්ෂණ 02 ක ලියන්න.
    (vii) ප්‍රසාද ස්නාපනයේදී භාවිතා කරන ලද සංකේත 02 ක් ලියන්න.
    (viii) සබත් දවසේ දී නොකළ යුතු කාර්යයන් 02 ක් ලියන්න.
    (ix) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය නිසි ලෙස ලබා ගැනීමට අවශ්‍ය පියවර 02 ක් ලියන්න.
    (x) චතාරික සමයේ ඔබ කරනු ලබන භක්ති අභ්‍යාස 02 ක් ලියන්න. (ල. 2 x 10 = 20)

02. (i) ශු. බයිබලය රචනා කිරීමේ දී පදනම් කරගත් කරුණු 02 ක් ලියන්න. (ල. 02)
    (ii) පැරණි ගිවිසුමේ අඩංගු පොත් 03 ක් ලියන්න. (ල. 03)
    (iii) ශු. බයිබලය ගෞරවාන්විතව පරිහරණය කිරීමේදී කළ යුතු කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

03. (i) පාස්කු අභිරහස යනු කුමක්ද? (ල. 02)
    (ii) ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වන ණය මංගල්‍යයන් 03 ක් ලියන්න. (ල. 03)
    (iii) ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

04. (i) ශු. සභාව තුළ ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමීත්වය ලබමින් සතුරන්ට ප්‍රේම කළ පුද්ගලයින් 02 ක් ලියන්න. (ල. 02)
    (ii) අසල්වැසියන්ට ප්‍රේම කිරීමට උගන්වන දේව පනත් 03 ක් ලියන්න. (ල. 03)
    (iii) ඔබට සතුරුකම් කරන අයට යහපත කිරීමට ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

05. (i) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන 02 ක ලියන්න. (ල. 02)
    (ii) දෙමව්පියන් වෙනුවෙන් දරුවන් ඉටු කළ යුතු යුතුකම් 03 ක් ලියන්න. (ල. 03)
    (iii) පූජා ප්‍රසාදිතුමන්ලාගේ සේවාවන් 05 ක් ලියන්න. (ල. 05)

06. (i) දේව ප්‍රසාද නිධානයක් යනු කුමක්ද? (ල. 02)
    (ii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නමැති දේව ප්‍රසාද නිධානය තුළ ඇතුළත් ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)
    (iii) දිව්‍ය සත්ප්‍රසාදය ලබා ඇති ඔබ දේව දරුවකු ලෙස ක්‍රියාකරන ආකාර 05 ක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (3) 02. (2) 03. (1) 04. (3) 05. (2) 06. (1) 07. (2) 08. (4) 09. (2) 10. (3)

11. (✓) 12. (X) 13. (X) 14. (✓) 15. (✓) 16. අයකැමියෙකි. 17. ජීවන හුස්ම

18. 04 කි. 19. හිරුඑළිය 20. 02 කි.

## II කොටස

01. (i) ◆ ව්‍යවස්ථාවලිය ◆ මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව ◆ නීතිය ◆ මෝසෙස් තුමාගේ නීතිය
(පිටු අංක 05)

(ii) ◆ ශු. මතෙව් සුබාරංචිය ◆ ශු. මාක් සුබාරංචිය ◆ ශු. ලූක් සුබාරංචිය ◆ ශු. ජොහාන් සුබාරංචිය
(පිටු අංක 08)

(iii) රන්ද, තුවරලා, ගන්ධරස (පිටු අංක 29)

(iv) ◆ සමගි සන්ධානය ◆ රෝගීන්ගේ ආලේපය (පිටු අංක 39)

(v) සෙබදි හා සලෝමි (පිටු අංක 10)

(vi) තම ස්වරූපය හා සමානකම (පිටු අංක 22)

(vii) ◆ ජලය ◆ සුදු වස්ත්‍රය ◆ පාස්කු ඉටිපහන ◆ ශු. තෛලය (පිටු අංක 43, 44)

(viii) ◆ දිව්‍ය පූජාව අතපසු කිරීම. ◆ අසංවර ඇඳුම් විලාසිතාවන්ගෙන් දිව්‍ය පූජාවට පැමිණීම.
◆ ඉරු දින අනවශ්‍ය ලෙස මුදල් ඉපැයීමේ කාර්ය නිරත වීම.
◆ දිව්‍ය පූජාවට හෝ දහම් පාසලට සහභාගී නොවී උපකාරක පංතිවලට හෝ විනෝද ගමන් යාම
..... ආදී පිළිතුරු (පිටු අංක 71)

(ix) ◆ තමාගේ පව් සිහිකිරීම. ◆ ඒවාට මනස්ථාපනය වීම. ◆ මින්මතු පව් නොකිරීමට සිතා ගැනීම.
◆ පව් සියල්ලම පියතුමාට දන්වා සිටීම. ◆ පියතුමා නියම කරන දඬුවම් ඉටු කිරීම..... ආදී පිළිතුරු
(පිටු අංක 50) (ල. 2 × 10 = 20)

(x) ◆ ශුද්ධ වූ පැය ◆ පාද නමස්කාරය ◆ මනස්ථාපන මෙහෙයන් ◆ ඥානකාන්ති ......... ආදී පිළිතුරු

02. (i) විශ්වාසය හා බලාපොරොත්තුව (පිටු අංක 02) (ල. 02)

(ii) ◆ යෙසායා ◆ ජෙරමියා ◆ වීරාවලිය ◆ දානියෙල් ..... ආදී පිළිතුරු (පිටු අංක 03) (ල. 03)

(iii) ◆ සුදු රෙද්දක් මත තැබීම ◆ පිරිසිදු ස්ථානයක තැබීම ◆ මල් තැබීම ◆ පහන් දැල්වීම
◆ දැතින්ම රැගෙන යාම ........ ආදී පිළිතුරු (ල. 05)

03. (i) ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය (පිටු අංක 70) (ල. 02)

(ii) ◆ සෑම ඉරුදිනක්ම
◆ ජනවාරි 01 - පරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය
◆ අගෝස්තු 15 - මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපණ මංගල්‍යය
◆ දෙසැම්බර් 03 - දෙව් මව්න්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය
◆ දෙසැම්බර් 25 - නත්තල් මංගල්‍යය (පිටු අංක 70) (ල. 03)

(iii) ◆ මුළු දිව්‍ය පූජාවට ක්‍රියාශීලීව සහභාගී වීම. ◆ දහම් පාසලට සහභාගී වීම.
◆ අධ්‍යාත්මික පෝෂණය ලබා දෙන වැඩ සටහන් වලට සහභාගී වීම.
◆ ශු. බයිබලය කියවා මෙනෙහි කිරීම. ◆ රෝගීන් බැලීමට යාම.
◆ අසරණයන්ට පිහිට වීම ....... ආදී පිළිතුරු (පිටු අංක 70, 71) (ල. 05)

04. (i) ◆ ශු. ස්තේපන් තුමා ◆ ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා (පිටු අංක 84, 85) (ල. 02)

(ii) ◆ මව්පියන්ට සංග්‍රහකරව ◆ ජීවිත විනාශ නොකරව ◆ කාමමිථ්‍යාචාරය නොකරව
◆ සොරකම් නොකරව ...... ආදී පිළිතුරු (පිටු අංක 75, 76) (ල. 03)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(iii) ◆ ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම. ◆ ඔවුන්ට සමාව දීම. ◆ ඔවුන්ගේ ක්‍රියා ඉවසීමෙන් කටයුතු කිරීම. ◆ ඔවුන්ට ප්‍රේම කිරීම. ◆ අන් මත ඉවසීම හා ගරු කිරීම. ◆ ඔවුන්ට කරුණාව දැක්වීම ...... ආදී පිළිතුරු (ල. 05)

05. (i) ◆ පූජකවරය ◆ ආශිර්වාදකාර බන්ධනය (පිටු අංක 53) (ල. 02)

(ii) ◆ දෙමව්පියන්ට කීකරු වීම. ◆ දෙමව්පියන්ට ගරු කිරීම. ◆ හොඳින් අධ්‍යාපනය ලැබීම.

◆ දෙමාපියන් රැකබලා ගැනීම ..... ආදී පිළිතුරු (පිටු අංක 56) (ල. 03)

(iii) ◆ සුවිශේෂය දේශනා කිරීම. ◆ සැබෑ එඬේරකු වීම. ◆ දිව්‍ය පූජාව පැවැත්වීම.

◆ දේව ප්‍රසාද නිධාන දානය කිරීම. ◆ දහම් පාසල් පවත්වාගෙන යම. ◆ ජනතාව ආසිරි ගැන්වීම. ..... ආදී පිළිතුරු (පිටු අංක 56) (ල. 05)

06. (i) උත්ථාන ව වැඩ සිටින දෙවි සමිඳුන් හමුවීම සඳහා ඇතුළතින් අප වෙත දානය කරනු ලබන දේව වරප්‍රසාද පිටස්තුර වශයෙන් සලකුණු කෙරෙන අයුරින් ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති සංඥා පිළිවෙත් (පිටු අංක 37) (ල. 02)

(ii) ◆ ඇතුළතින් ලබා දෙන දේව වරප්‍රසාද ලබා දීම. ◆ බාහිර ලෙස එය සලකුණු කිරීම.

◆ ක්‍රිස්තුස් වහන්සේ ස්ථාපිත කර තිබීම. ◆ වත්පිළිවෙත් අඩංගු වීම. (පිටු අංක 37) (ල. 03)

(iii) ◆ ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී වීම. ◆ දෙව වචනය කියවා මෙනෙහි කිරීම. ◆ නිතර නිතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම. ◆ අන් අයට ප්‍රේම කිරීම. ◆ දිනපතා යාච්ඤා කිරීම ..... ආදී පිළිතුරු (ල. 05)